## වයඹ පළාතේ 1994 අංක 03 දරන මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය

වයඹ පළාතේ 1990 අංක 08 දරන මුදල් ප්‍රඥප්තිය යටතේ එකතු කරන ලද මුද්දර ගාස්තු, වයඹ පළාතේ පළාත් පාලන ආයතන වලට හැරවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ ප්‍රඥප්තිය වයඹ පළාතේ 1994 අංක 03 දරන මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. මෙම ප්‍රඥප්තියට ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබීමෙන් පසු එය ක්‍රියාත්මක වේ.

**ලුහුඬු නාමය**

2. වයඹ පළාතේ 1991 අංක 2, 1991 අංක 4 හා 1992 අංක 01 දරන ප්‍රඥප්ති වලින් සංශෝධිත වයඹ පළාතේ 1990 අංක 08 දරන මුදල් ප්‍රඥප්තිය යටතේ පළාත් සභාව විසින්, වයඹ පළාතේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමා ඇතුළත පිහිටි යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් වූ යම් සාධන පත්‍රයක් වෙනුවෙන් යම් මුද්දර ගාස්තුවක් අයකර, එකතු කර, වයඹ පළාතේ පළාත් සභා අරමුදලට ගෙවා ඇති අවස්ථාවක, පළාත් සභාව විසින් ඒ මුද්දර ගාස්තුව අයකර, එකතු කරනු ලැබුවේ යම් නිශ්චල දේපලක් පැවරීම සම්බන්ධයෙන් ඒ නිශ්චල දේපල පිහිටා ඇත්තේ යම් පළාත් පාලන ආයතනයක පරිපාලන සීමාවන් ඇතුළත ද, ඒ පළාත් පාලන ආයතනයේ ප්‍රධාන පරිපාලන නිලධාරියා විසින් ඉහත කී පරිදි ඒ මුද්දර ගාස්තුව අයකර, එකතු කරන ලද වර්ෂයේ දෙසැම්බර් මස 31 වැනි දින සිට අවුරුදු 05 ක් වූ කාලසීමාවක් ඇතුළත වයඹ පළාත් අමාත්‍ය මණ්ඩලයේ මුදල් පිළිබඳ විෂය භාර අමාත්‍යවරයා වෙත ලියවිල්ලකින් හිමිකමක් ඉදිරිපත් කරන ලද විට, පළාත් සභාව විසින් ඒ පළාත් පාලන ආයතනයට ඒ මුද්දර ගාස්තුවේ මුදල හැරවිය හැකි ය.

**මුද්දර ගාස්තු**

3. 2 වැනි වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද කිසිම හිමිකමක්, ඒ හිමිකමෙහි සඳහන් කරන ලද මුද්දර ගාස්තු ගෙවීම පිළිබඳව, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් හෝ ඔහු විසින් ඔහු වෙනුවෙන් නම් කරන ලද වෙනත් යම් නිලධරයකු විසින් සහතික කරන ලද, උපලේඛනයක් ඒ හිමිකම සමග ඉදිරිපත් කරනු නොලැබුවහොත්, වලංගු නො වන්නේ ය.

**රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගේ සහතිකය.**

4. මේ ප්‍රඥප්තියෙහි පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, ප්‍රධාන පරිපාලන නිලධාරියා යන්නෙන් :

**අර්ථ නිරූපනය.**

(අ) මහ නගර සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් එහි නාගරික කොමසාරිස්වරයා; සහ

(ආ) නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් සම්බන්ධයෙන් යෙදෙන විට, ඉන් එහි ලේකම්වරයා

අදහස් වෙයි.

"පළාත් පාලන ආයතනය" යන්නෙන් යම් මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර, එවැනි සභාවක් විසින් ක්‍රියාත්මක කරන සහ ඉටු කරන බලතලවලට, කාර්ය වලට සහ කර්තව්‍යවලට අනුරූපී වන හෝ සමාන වන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා පිහිටුවනු ලබන වෙනත් යම් අධිකාරියක් ද ඊට ඇතුළත් වේ.

සාධන පත්‍ර යන්නෙහි, 1990 අංක 08 දරන වයඹ පළාතේ මුදල් ප්‍රඥප්තියේ ඇති අර්ථයම ඇත්තේ ය.

"පළාත් සභාව" යන්නෙන් ශ්‍රී ලංකා ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව අදහස් වේ.

5. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර අනනුකූලතාවයක් ඇති වූ විටක, සිංහල භාෂා පාඨය බල පවත්වන්නේ ය.

**අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල පාඨය බල පැවැත්විය යුතු බව.**

03-04/2

---

යොමු අංකය : ව/පස/2/1/19.

### වයඹ පළාත් සභාව

## වයඹ පළාතේ 1994 අංක 04 දරන අධිකරණ දඩ හැරවීමේ ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වයඹ පළාතේ පළාත් සභාව විසින් 1994.11.15 වැනි දින සම්මත කරන ලදුව, 1994.12.16 වැනි දින වයඹ ආණ්ඩුකාරවරයා විසින් අනුමත කර ඇති පූර්වෝක්ත ප්‍රඥප්තිය සියළු දෙනාගේ දැනගැනීම සඳහා මෙහි පහත පළ කරමි.

සම්පත් එම්. දසනායක,
ලේකම්,
වයඹ පළාත් සභාව.

1996 ජනවාරි මස 17 වැනි දින,
කුරුණෑගල.
වයඹ පළාත් සභාවේ සභා කාර්යාලයේ දී ය.